# දුරකථන බැංකුකරණ සේවා නීතිරීති හා කොන්දේසි

**පහත දැක්වෙන නීතිරීති හා කොන්දේසි මඟින් හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් ශ්‍රී ලංකා (මින් මතුවට 'බැංකුව' යනුවෙන් හැඳින්වේ) හි දුරකථන බැංකුකරණ සේවාව පාලනය වනු ඇත.**

1. බැංකුව විසින් සපයන දුරකථන බැංකුකරන සේවාවට පහත දෑ ඇතුළත් වේ:

   - ගිණුම් හිමියාගේ ඕනෑම ගිණුමක් අතර අරමුදල් හුවමාරු කිරීම,
   - කලින් නිශ්චය කළ සහ එකඟ වී ඇති හුවමාරු සීමාවක් තුළ ගිණුම් හිමියාගේ ඕනෑම ගිණුමකින් ගිණුම් හිමියා විසින් දුරකථන බැංකුකරණ සේවාව යටතේ අරමුදල් ලැබීමේ කාර්යය සඳහා ලිඛිතව නම් කර ඇති වෙනත් ඕනෑම ගිණුමක් අතර අරමුදල් හුවමාරු කිරීම. (කැපවූ හුවමාරුලාභී ගිණුමක්),
   - ගිණුම් ශේෂය පිළිබඳව, (ගිණුම් හිමියාගේ ගිණුමට අදාළව) කලින් සිදුකළ ගනුදෙනු, විනිමය අනුපාත හා තැන්පතු අනුපාත පිළිබඳව විමසීම්,
   - ගිණුම් හිමියාගේ ගිණුමට අදාළව ගිණුම් ප්‍රකාශන (තෝරාගත් ගිණුම් වර්ග සඳහා පමණි), චෙක්පොත් හා චෙක්පත් ගෙවීම් නතර කිරීමේ ඉල්ලීම්, සහ
   - බැංකුව විසින් කලින් කලට හඳුන්වා දෙනු ලබන වෙනත් ආකාරවල බැංකු හෝ ආයෝජන සේවාවන්.

2. ගිණුම් හිමියා විසින් දුරකථන මගින් ලබාදෙන ගිණුම් හිමයාගේ උපදෙස් මත ක්‍රියාකිරීමට බැංකුවට අවසර ලබාදෙන නමුත් එසේ ක්‍රියාකිරීමට බැංකුව බැඳී නැති අතර, අනවසර පුද්ගලයන් වෙතින් ලැබෙන බවට බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි විශ්වාස කරන දුරකථන උපදෙස් කිසිවක් මත ක්‍රියා කිරීමට බැංකුවට අවසර ඇති බවට හෝ දුරකථන උපදෙස් ලබාදෙන තැනැත්තන්ගේ අනන්‍යතාවය තහවුරු කරගැනීමට යම් වගකීමක් ඇති බවට ගිණුම් හිමියා එකඟ වේ.

3. බැංකුව විසින් ගිණුම් හිමියා වෙත සපයා ඇති දුරකථන බැංකුකරණ රහස්‍ය අංකය සියලුම අවස්ථාවන් හි දී ඉතා රහසිගත ආකාරයෙන් තබාගැනීමට ගිණුම් හිමියා භාරගෙන සිටින අතර, එම රහස්‍ය අංකය නැතිවූ විට හෝ අනවසර පාර්ශ්වයකට එම රහස්‍ය අංකය හෙළිදරව් වී ඇති බවට දැනගත් විට වහාම බැංකුව වෙත වාර්තා කළ යුතු ය.

4. යම් උපකරණ අවක්‍රියාකාරීත්වයක්, හෝ ඇණහිටීමක් ද ඇතුළත්ව සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් බැංකුවේ පාලනයෙන් බැහැර හේතුවක් නිසා ඇතිවන යම් දුරකථන උපදෙසක් ක්‍රියාවේ යෙදවීමට අසමත්වීමක් සම්බන්ධයෙන් බැංකුව ගිණුම් හිමියා වෙත වගකීමට බැඳී නොමැති අතර, කිසිදු තත්ත්වයක් යටතේ ක්‍රියාත්මක කිරීමක් සම්බන්ධව හෝ ඉන් පැනනගින යම් ඍජු, වක්‍ර හෝ ආනුෂංගික හානි සම්බන්ධව බැංකුව ගිණුම් හිමියා වෙත වගකීමට බැඳී නොමැති අතර, බැංකුව විසින් දුරකථන උපදෙස් පිළිගැනීම තුළින් හෝ ඒ සම්බන්ධයෙන් හෝ ඒ මත ක්‍රියා කිරීමෙන් හෝ ක්‍රියාකිරීමට අසමත්වීමෙන් ඍජුව හෝ වක්‍රව පැනනගිනු ඇති සියලුම නඩුකර, නඩු කටයුතු, අයැදීම්, හානි, පාඩු, හා පිරිවැය හා වියදම් වලින් බැංකුව හානිපූරණය කිරීමට සහ බැංකුව හානිවලින් වලක්වා තැබීමට ගිණුම් හිමියා එකඟ වේ. මෙම දුරකථන බැංකුකරණ සේවාව අවසන්වීම නොතකා මෙම හානිපූරණය අඛණ්ඩව පවතිනු ඇත.

5. මෙම නීතිරීති හා කොන්දේසි යටතේ දුරකථන උපදෙස් ලබාදීමට ගිණුම් හිමියාට ඇති අයිතිය සියලුම අවස්ථාවන් හි දී බැංකුවෙහි අභිමතයට යටත් වන අතර, බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී පූර්ව දැණුම් දීමකින් තොරව එම අයිතිය අවලංගු කළ හැකි ය.

6. දුරකථන හෝ වෙනත් උපදෙස්වල කාර්යයන් සඳහා ගිණුම් හිමියාගේ ගිණුමෙහි සහ/හෝ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් (හෝ කලින් නියමකරගත් ණයවර පහසුකම්) පවතින බවට ගිණුම් හිමියා වගබලාගත යුතු අතර, අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එවැනි යම් උපදෙසක් ක්‍රියාවේ යෙදවීමට බැංකුවෙහි අසමත්වීමෙන් පැනනගිනු ඇති යම් ප්‍රතිඵල සම්බන්ධව බැංකුව වගකීමට ලක් නොවනු ඇති අතර, එම ප්‍රමාණවත් නොවීම නොතකා බැංකුව විසින් සිය තනි අභිමතය යටතේ එම උපදෙස් ක්‍රියාවේ යෙදවීමට තීරණය කළ හැකි අතර, ගිණුම් හිමියාගේ පූර්ව අවසරය හෝ දැණුම්දීමක් නොමැතිව බැංකුව විසින් එසේ කළ හැකි අතර, එයින් ඇතිවන අයිරාවක්, අත්තිකාරමක් හෝ ණයක් සඳහා සහ ඊට අදාළ සියලු ගාස්තු සඳහා ගිණුම් හිමියා වගකීමට යටත් වේ. එම අයිරාව, අත්තිකාරම හෝ ණය මුදල බැංකු විසින් සිය තනි අභිමතය යටතේ නිශ්චය කරනු ඇති පොළී අනුපාතයන්ට යටත් වනු ඇති අතර, එවැනි ගිණුම් සඳහා අදාළ වන බැංකුවේ සාමාන්‍ය නීතිරීති හා කොන්දේසි මඟින් එකී ගිණුම් පාලනය වනු ඇත.

7. ගිණුම් හිමියා විසින් ලබාදුන් දුරකථන උපදෙස් මත බැංකුව විසින් සිදුකරන ලද ගනුදෙනුව සම්බන්ධ තොරතුරු කැප වූ හුවමාරුලාභී ගිණුමෙහි හිමිකරුවා/හිමිකරුවන් වෙත ගිණුම් හිමියා විසින් දැණුම් දිය යුතුය. එවැනි උපදෙස් ලබාදීම සම්බන්ධයෙන් බැංකුව ගිණුම් හිමියා වෙත කිසිදු වගකීමකට බැඳී නොමැත.

8. කලින් කලට සිය තනි අභිමතය යටතේ සුදුසු යැයි සලකන ආකාරයෙන් සේවා ගාස්තුවක් සහ/හෝ වෙනත් අයකිරීම් පැනවීමට බැංකුවට අයිතිය පවතී.

9. කලින් කලට සිය තනි අභිමතය යටතේ සුදුසු යැයි සලකන ආකාරයෙන් දුරකථන බැංකුකරණ සේවාවෙහි විෂයපථය හෝ මෙහි ඇති වෙනත් යම් නීතිරීති හා කොන්දේසි වලට එකතුකිරීම්, මකාදැමීම්, හෝ වෙනස්කිරීම් සිදුකිරීමට බැංකුව අයිතිය රඳවා ගනියි.

10. මෙම සේවාවට ප්‍රවේශවීම සඳහා බැංකුව විසින් සපයා ඇති දුරකථන බැංකුකරණ රහස්‍ය අංකය හා පෞද්ගලික බැංකුකරණ අංකය භාවිතා කිරීම හෝ බැංකුව විසින් නිකුත් කර ඇති ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත් අංකය භාවිතා කිරීම මෙම නීතිරීති හා කොන්දේසි ගිණුම් හිමියා විසින් පිළිගැනීමක් ලෙස අර්ථනිරූපනය කෙරෙනු ඇත.

11. බැංකුවේ දුරකථන බැංකුකරණ සේවාව හරහා හරස් ව්‍යවහාර මුදල් ගනුදෙනු සිදුකිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති විනිමය පාලන රෙගුලාසි මඟින් ගිණුම් හිමියා / හිමියන් පාලනය වනු ඇත.

12. මෙම නීතිරීති හා කොන්දේසිවල සිංහල හා දෙමළ පරිවර්තන බැංකුවෙහි වෙබ් අඩවියෙන් (www.hsbc.lk) ලබාගත හැකි අතර, එසේම බැංකුවේ සියලුම කාර්යාල සහ/හෝ ශාඛා වෙතින් මුද්‍රිත ආකාරයෙන් ද ලබාගත හැකිය.

13. ඉංග්‍රිසි, සිංහල හා දෙමළ ආකෘති අතර යම් අනනුකූලතාවයක් ඇතිවවුහොත් එවිට ඉංග්‍රිසි ආකෘතිය බලාත්මකව පවතිනු ඇත.

14. මෙම නීතිරීති හා කොන්දේසි ශ්‍රී ලංකාවේ පවතින නීතිරීතිවලින් පාලනය වන අතර, ඊට අනුව අර්ථනිරූපනය කෙරෙනු ඇත.

බැංකුවෙහි දුරකථන බැංකුකරණ සේවාව පාලනයවන ඉහත සඳහන් නීතිරීති හා කොන්දේසි කියවා බලා තේරුම් ගත් බවට මම/අපි මෙයින් තහවුරු කරමි/මු.

____________________________

නම :………………….…………

ජා.හැ. අංකය : ………………….

දිනය :………………….